

# පෘථිවිය මත
# දෙවියන්වහන්සේගේ රාජ්‍යය

ලෝකය සඳහා දෙවියන්වහන්සේගේ වැඩ සටහන

*(The Kingdom of God on Earth)*

*(GOD'S PLAN FOR THE WORLD)*

# පෘථිවිය මත දෙවියන්වහන්සේගේ රාජ්‍යය

ලෝකය සඳහා දෙවියන්වහන්සේගේ වැඩ සටහන

- ස්ටැන්ලි සීවන් -

# පටුන


| | |
|---|---|
| බයිබලය - තොරතුරු වල එකම ප්‍රභවය | 3 |
| නියම රාජ්‍යයක් | 4 |
| ලස්සන ලෝකයක් | 4 |
| "ඔබගේ රාජ්‍යය එනු ලැබේවා" | 5 |
| එය ඇතිවන්නේ පොළවේ කොතැනද ? | 6 |
| යුදෙව් රාජ්‍යයේ පිහිටීම | 7 |
| යෙරුසෙලම ලෝකයේ කේන්ද්‍රය | 8 |
| ලෝකය මත විනිශ්චයන් | 9 |
| රාජ්‍යය ආරම්භ වේ | 10 |
| රාජ්‍යයේ ජනයා | 10 |
| අමරණීය වූවන් | 11 |
| ක්‍රිස්තුස්වහන්සේ සමඟ පාලකයෝ | 12 |
| සදාකාල ජීවනයේ ප්‍රමිතිය | 12 |
| වසර දහසක සාමය | 13 |
| යුක්තියේ යහපත් ක්‍රමය | 13 |
| හොඳ සෞඛ්‍යය | 14 |
| සියල්ලන්ගේ යහපත සඳහා ලෝක සම්පත් | 15 |
| සම්පූර්ණත්වයෙන් ජීවත් වීම | 16 |
| අරාබිහු යුදෙව්වෝ සමඟ වැඩ කරති | 17 |
| එය කොපමණ කලක් පවතීද? | 17 |
| "ඔබගේ රාජ්‍යය එනු ලැබේවා" | 18 |

# පෘථිවිය මත දෙවියන්වහන්සේගේ රාජ්‍යය

## ලෝකය සඳහා දෙවියන් වහන්සේගේ වැඩ සටහන

බාහිර අභ්‍යවකාශයේ සිට පෘතුවි ග්‍රහයාගේ පෙනුම ඇත්තන්ම අලංකාරය. මෙය ස්ථිර කළේ එදෙස බලා සිටි අභ්‍යවකාශගාමීන්ය. පෘතුවිය දෙවියන් වහන්සේගේ මැවිල්ලෙහි අලංකාරතම මැණික වන අතර එය මුලු විශ්වයම තුළින් උන් වහන්සේගේ රාජ්‍ය එළිදරව් කිරීමට පොරොන්දු වූ ස්ථානය වේ. එය ඒ තරම්ම අලංකාර වන්නේ ඒ නිසාය.

සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහයින් අතරින් මහපොළොව වනාහි සියළු වර්ගවල පිවින් සඳහා සුදුසු ග්‍රහ ගමන් මග අනුව මිනිස් වර්ගයාගේ වාසය සඳහා සැපදායක තත්වයක් ඇති සූර්යයායට නියම දුරින් පිහිටි එකම ග්‍රහයා වේ.

## බයිබලය - තොරතුරු වල එකම ප්‍රභවය

බයිබලයෙන් පමණක් මෙය විස්තර කල හැක. කාරණය ඒ මැවුම් කරු පොළොව මවා සදා එය පිහිටෙව්වා වූ හිස්කමට නොමවා <u>වාසය</u> පිණිස එය සෑදුවා වූ දෙවියන් වහනසේ මෙසේ කියනසේක. "මම ස්වාමීන් වහන්සේය. මා හැර වෙන කෙනෙක් නැත." (යෙසෙයා 45:18)

ඉදින් මහත් නිර්මාණකරුවෙකු සිටියේ නම්, මේ ග්‍රහයාගේ වාසය පිණිස වසන්නන් සැදි නම්, වෙන තැනක නොව මෙහි විසිමට නම්, ඔහුගේ සිතෙහි මහත් වූ අවසාන වැඩ සටහනක් ඇති බව පිළිගැනීම තර්කානුකුලය. මේ අරමුණ කුමක් දැයි සැක කිරීමට අපට ඉඩ නොතැබීම සතුටකි. දෙවියන් වහන්සේ මිනිස් වර්ගයා මේ පොළොව මත තැබූ දින පටන් ඔහුගේ එකම උතුම් බලාපොරොත්තුව වූයේ, ඔහුගේ මැවීම ඔහුගේ ම පැහැදිලිකම ගැන කැමැත්තෙන්ම ප්‍රතිචාර දෙන්නේය යන්න විය.

"ජලයෙන් මුහුද පිරියන්නා මෙන් ස්වාමීන් වහන්සේගේ තේජස ගැන දැන ගැනීමෙන් පොළාව පිරී යන්නේය." (හබක්කුක් 2:14)

මේ සම්පූර්ණ වීම් වල අවසානය වන්නේ, බයිබලය පවසන පරිදි මහපොළාව මත දෙවියන් වහන්සේගේ රාජ්‍යයය.

## නියම රාජ්‍යයක්

එය දේශපාලන හා භෞතික වශයෙන් නියම රාජ්‍යයක් වී රජෙකු සිටින අතර ආණ්ඩුවක් ප්‍රධාන නගරයක්, ජාත්‍යන්තර නීති ක්‍රමයක් ඇතිවේ. දෙවියන් වහනසේ දැනටමත් ස්වර්ගයේ හා පොළොවේ සියළු බලය "උන් වහන්සේගේ පුත්‍රයාට, යේසුස්වහන්සේට භාර දී ඇත." තවත් මොනවාද "දිව්‍යමය දින දර්ශනයේ දිනය යොදා ඇති බව අපි ඉගෙන ගනිමු."

"තමන් වහන්සේ විසින් පත්කළ මනුෂ්‍යා ලවා ලෝකයේ ධර්මිෂ්ඨකමෙන් විනිශ්චය කිරීමට එක් දවසක් නියමකර තිබේ." (ක්‍රියා 17:31)

පොළොව මත දේව රාජ්‍ය ඉක්මනින් පැමිණේ. මෙය ස්ථිර කරන බොහෝ සලකුණු මේ පොතෙහි විෂය නොවේ. නමුත් අප ස්ථිරවම සිතන්නේ එය එසේ වන්නේය කියාය. මේ එන්නා වූ සහශ්‍ර වර්ෂය ලෝකයේ කිසිදිනක නොදුටු මහත් පුදුම සහිත එකක් වන්නේය. ඉතිහාසයේ වූ "අවබෝධයේ යුගය" "ශ්‍රේෂ්ඨ යුගය" ආදි නම් වලින් දැක්වූ යුගවල් සියල්ල වසා ගන්නේය. දේව රාජ්‍ය මේ ප්‍රිය ග්‍රහයාට යහපත් පරිසරයක් ඇති කර දෙවියන් වහන්සේ ශ්‍රේෂ්ඨ මැවුම් කරු ලෙසත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ලෝකයේ රජු වශයෙන් අවබෝධ කරන අයට දෙන්නේය.

## ලස්සන ලෝකයක්

ඔබේ කල්පනාව මොහොතකට යොදන්න, ලෝකයේ සාමය ගැන සිතන්න. එහි පදිංචිකරුවන් සෞඛ්‍ය සම්පන්නව මනාව ආහාර ලැබ, ඵල ලබන ක්‍රියා කරමින් සිටින ලෝකයයක් ගැන සිතන්න. විරැකියාව නොමැති, ශ්‍රමය සූරා කෑමක් නොමැති, පොහොසත් එමෙන් ම දිගු ආයුෂ ඇති මිනිසුන් සහිත ලොවක් ගැන සිතන්න. දුර්භික්ෂය සහ සාගතය තවදුරටත් ලොවින් කොටසක් ඝාතනය නොකරන, පොළොව සහ සාගරයේ අස්වැන්න උපරිමයෙන් ගන්නා ලොවක් ගැන සිතන්න. දැනටමත් ඔබ දේව රාජ්‍යය ගැන චිත්‍රයක් ලබා ඇත.

ආගමික වාද, විවාද සහ ජාතිවාදී අරගල නොමැති බව හොඳින් කල්පනා කර බලන්න. ජාත්‍යන්තරව පිලිගත් නීති පද්ධතියක් ගැන සිතන්න. යහපත් මනසක් අති යුක්ති සහගත විනිසුරුවන් සමථය කරන ත්‍රස්තවාදය හා ළමා අපචාර රහිත යහපත් අසල් වැසියන් ඇති සියල්ලන්ට පරිත්‍යාග ගිලිතත්වයක් ඇති ලොවක් ගැන සිතන්න. එය දෙවියන් වහන්සේගේ පොළොව මත ප්‍රීතිමත් රාජ්‍යයක් සහ සාධාරණ විනිශ්චයක් ඇති කරන්නේය යන්න පැහැදිලි බලාපොරොත්තුවකි. සමහරුන්ට මෙම රාජ්‍ය මිනිසා විසින් ඔහු සඳහාම කවදා හෝ පොළොව මත පිහිටුවන සිහින රාජ්‍යයක් පමණි. අන්

අයට රාජ්‍ය අහසේ ඇති ස්වර්ගීය සැප ඇති සිහිනයකි. නමුත් කරුණු ගැන අවධානයෙන් සලකන්නා මෙවන් ලොවක් අපට කවදා හෝ අයිති නො වන බැව් දැන ගනී. ඕනෑම කෙනෙක් ඔහුගේ බයිබලය ප්‍රවේශමෙන් කියවන්නේ නම් මරණයෙන් පසු ස්වර්ණමය ජීවිතයක් ගැන සාමාන්‍ය විශ්වාසයක් නොමැති බව නිසැකව දන්නේය. රාජ්‍ය අව්‍යප එකක් වන අතර ස්පර්ෂ කලහැකි ලෝක අධිරාජ්‍යයක් නුදුරු අනාගතයේ ස්වර්ගයේ සිට යේසුස් වහන්සේ පොළොවට පැමිණි විට පිහිටුවන්නකි.

## "ඔබගේ රාජ්‍ය එනු ලැබේවා"

යේසුස් වහන්සේගේ ගෝලයන්ට යාච්ඤා කිරීම දුෂ්කර කටයුත්තක් විය. කුමක් සඳහා යාච්ඤා කරන්නේ ද? මූලිකත්වය දියයුතු කුමක්ද? අප "ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව" වශයෙන් හඳුන්වන යාච්ඤාව උගැන්වීමෙන් ස්වාමීන් වහන්සේ ඔවුන්ගේ ගැටළුව විසඳූ සේක. එය ඔවුන්ගේ මූලික ප්‍රමුඛතා කියා දුනි, දෙවියන් වහන්සේ පියෙකු වන බව හා සපයන්නෙකු වන බව, දෙවියන් වහන්සේට ස්වර්ගයේ තම අණ පිළිපදින රාජ්‍යයක් පවතින බව. උන් වහන්සේගේ රාජ්‍ය පොළොවට පැමිණීමට ඇත්තේය. එය කිරීමට බල සම්පන්න කන්නලව්වකි.

"ඔබගේ රාජ්‍යය එනු ලැබේවා. ස්වර්ගයේ මෙන් පොළොවේද ඔබගේ කැමත්ත ඉටුවේවා. රාජ්‍ය ඔබගේය. බලය හා මහිමය සදහටම ඔබගේය." (මතෙව් 6: 9-13)

ක්‍රිස්තියානියෙහි මෙම යාච්ඤාව තවමත් පුරුද්දක් ලෙස කෙරේ. "ඔබගේ රාජ්‍ය එනු ලබේවා" යන්න විශ්වාසී ක්‍රිස්තියානීන්ගේ මුවෙහි නිතර තිබිය යුත්තකි.

බොහෝ කොටසක් මිනිසුන් ක්‍රියා කරන්නේ ඔවුන් අවට මැවුම් කරුවෙකු හා ලෝකය ගැන බලාපොරොත්තුවක් නැති ලෙසය. ඔවුනට සමාවක් නොලැබෙනු ඇත. මිනිස් සිරුරේ පුදුමයන් ද පැලැට්වල ජීවිතයද බලන්න. ඒවා අහම්බෙන් හෝ සකස් කිරීමෙන් වීද? අදේව වාදීන් පවා බලවත් ලෙස පුදුම වන්නේ ජීව සෛල ගැනය. ඔහුගේ කාලයේ හොඳින් උගත් අයකු වූ අපෝස්තුලු පාවුල් අදේව වාදීන්ට ප්‍රකාශ කලේ ඔවුන් පිළිගත නොහැකි වන්නේ දෙවියන් ගැන දැනුම ඔවුන් තුල ඇතිකර ඇති නිසාවෙන් බවය. දෙවියන් වහන්සේගේ ගැන දත හැකි සියල්ල ඔවුන් ඉදිරියේ සක්සුදක් සේ පැහැදිලිය. දෙවියන් වහන්සේ එය ඔවුනට අනාවරණය කර දී ඇත. ලෝකය මැවූ තැන් සිට ඇසට නො පෙනෙන උන් වහන්සේගේ දිව්‍ය ලක්ෂණ වන උන් වහන්සේගේ සදාතන බල මහිමයත්, දේවත්වයත් ඔවුන්ගේ මනසට පෙනී යන

පරිදි උන් වහන්සේගේ මැවිලි වලින් ප්‍රකාශ කර ඇත. එබැවින් ඔවුන්ගේ නිදහසට ඉදිරිපත් කළ කරුණු කිසිවක් නැත. (රෝම 1: 19 - 20)

ඉදින් දෙවි කෙනෙක් ඇත්නම්, ඔහුට මිනිස් වර්ගයා ගැන අනාගතයක් ඇත්තේය. අපට ඇත්තෙන්ම ඒ ගැන කියා ඇද්ද? ඇත්තෙන්ම ඔහු කියා ඇත. පටන් ගැන්මේ සිට අවසානය දක්වා මුළු බයිබලය පොළොව සඳහා ඔහුගේ වැඩ පිළිවෙළ එළිදරව් කරයි. ඔහු ප්‍රොප්ත වරු මගින් "පියවරුන්ට" කතා කලේය. එසේම "මෙම අන්තිමයේ දවස් වල දි සියලු දේවල් සඳහා පත් කළ උන් වහන්සේගේ පුත්‍රයා මගින් පවසන ලදි" (හෙබ්‍රෙව් 1:1-2) ක්‍රිස්තුස් වහන්සේගේ සුභ ආරංචියේ මධ්‍ය එය වූයේ ඒ නිසාය.

"උන්වහන්සේ ඔවුන්ගේ සිනගෝග වල උගන්වමින් රාජ්‍යයේ සුභආරංචිය දේශනා කරමින් මුළු ගලීලය පුරා ගිය සේක." (මතෙව් 4:23) ඔහු එම රාජ්‍ය ඇතිවන කාලය ගැන සැකයක් නොතැබීය.

"මනුෂ්‍ය පුත්‍රයා සියලු දේව දූතයන් සමඟ තමන්ගේ තේජසින් එන කල ස්වකීය තේජසේ සිංහාසනයේ වැඩ සිටින සේක. එවිට සියලු ජාතිහු උන් වහන්සේ වෙතට රැස් කරනු ලබන්නෝය." (මතෙව් 25:31-32)

## එය ඇතිවන්නේ පොළොවේ කොතනද?

මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට පෙර අපි මොහොතක් පැරණි ගිවිසුම් කාලය දෙස ආපසු බලමු. ඒ කාලයේ යුදෙව්වරු සිතුවේ දේව රාජ්‍ය පලස්තිනයේ පමණක් ඇති වේය කියාය. හොඳින් අවබෝධය ඇති යුදෙව්වන් දෙවියන් වහන්සේ පොරොන්දු වූ කානන් (පලස්තිනයට කී පුරාණ නම) දේශය ඒබ්‍රහම් ඊසාක් හා යාකොබ්ට පොරොන්දු වූ බව දැන සිටියහ. (උත් - 15:18, 17:8) දෙවියන් වහන්සේ පොළොවේ මේ කොටස ගැන විශේෂ සැලකිල්ලකින් බැලූ සේක. පලස්තිනය ඔහුගේ දේශය වූයේ එය තුල හා ඒ අවට ජාතීන් සමඟ ඔහුගේ බලාපොරොත්තුව පෙන්නුම් කළ නිසාවෙනි. ඒ හොඳ දේශයක් විය. දි කිරි හා මී පැණි ගලන්නා වූ දේශයක්, හොඳින් ජලය ඇති අස්වැන්න හා පළතුරු සඳහා හොඳ විය. යුදෙව්වරු ඔවුහු "තෝරාගත් වංශය" බව දත්හ. එසේ වූයේ ඔවුනගේ පිය වූ එබ්‍රහම්ගේ ඇති අසාමාන්‍ය විශ්වාසය නිසා දෙවියන් වහන්සේගේ හා ඊශ්‍රායල්වරු අතරේ ඇති වූ විශේෂ සබඳතා නිසා ඔවුහු උන් වහන්සේගේ සෙනඟ වූහ.

ඊජිප්තුවෙන් නික්මයාමෙන් පසුව, දෙවියන්වහන්සේ සහ ඊශ්‍රායෙල්වරු අතර සබඳතාවක් ගොඩ නැගුනු අතර, ඔවුන් දෙවියන්ගේ රාජ්‍යය ලෙස නම්කරනු ලැබීය.

දෙවියන්වහන්සේ ඔවුන්ගේ නායකයා වූ අතර ඔවුන් උන්වහන්සේගේ සෙනග විය.

"නුඹලා සැබවින්ම මාගේ සියලු හැඬට කීකරුව මාගේ ගිවිසුම රාක්ෂා කරන්නාහු නම් සියලු සෙනඟ අතර අතුරින් නුඹලාට අසාහය වස්තුවක් වන්නාහුය. නුඹලා මට පූජක රාජයක් ශුද්ධ වූ ජාතියක් වන්නාහුය." (නික්ම යාම 19:5-6)

ඊශ්‍රායල් වරුන්ට බොහෝ කලක් මේ ලාභයට ලැබුන පොරොන්දුවේ තමන්ගේ කොටස ඉටුකිරීමට අපොහොසත් වුහ. නිතරම ඔවුන් අවට සිටි ජාතින්ගේ තත්වයට වැටින. නමුත් ඔවුහු ඔවුන්ගේ මුල් අවස්ථාවේ දාවිත්ගේ කාලයේ හා ඔහුගේ පුත් සොලමන්ගේ කාලයේ දෙවියන් වහන්සේගේ රාජ්‍ය කුමක් වැනිද යන්න අත්දුටහ. ඔවුහු සාර්ථකව දියුණුවී දේශය සාමයෙන් පිරුණි. දාවිත් රජු විසිනි එය සංක්ෂිප්ත ගත කරනු ලැබූයේ:

"ඔහු (දෙවියන් වහන්සේ) මාගේ පුත් සොලමන් ඊශ්‍රායල් හි ස්වාමීන් වහන්සේගේ රාජ්‍යයේ සිංහාසනය මත හිඳ ගැනීමට තෝරාගත් සේක." ( 1 වංශාවලි 28:5)

## යුදෙව් රාජ්‍යයේ පිරිහීම

කණගාටුවට, මෙම ඊශ්‍රායල් ඉතිහාසයේ සෞභාග්‍ය කෙටිකලක් විය. මිනිස් දුබලතා අහංකාරමකම හා දිව්‍යමය තත්වය ගැන නොසැලිකිලිමත්කම නිසා එය පහත වැටිණ. දෙවියන් වහන්සේ රජු වශයෙන් පෙනීම වහා අවසන් විය. එහෙයින් සියවස් කිහිපයකට පසුව දෙවියන් වහන්සේ රජ පරම්පරාව අවසන් කලහ. ජෙරුසෙලමට බැබිලෝනියානු ප්‍රහාරය ආසන්න විය. දැකිය හැකි දේව රාජ්‍යයක් තවත් බොහෝ කලකට නොවීය.

අවසන් වරට රජුකියන ලද්දේ:

"මම එය පෙරලා දමමි පෙරලා දමමි. පෙරලා දමමි. එයට හිමිකරු එනතුරු එය තවත් නොවන්නේය. මම ඔහුට එය දෙමි." (එසකියෙල් 21:27)

එම ප්‍රකාශය අති ප්‍රබල පෙරකීමක් වූයේ රාජවංශයේ විනාශය මහත් හිමිකරු එනතුරු වෙනත් වචනයකින් යේසුස් වහන්සේ එනතුරු, දේව රාජ්‍යය පොලොව මත නැවත පෙනී නො සිටින නිසාය. වෙනත් වචන වලින් කියනවා නම්, දේව රාජ්‍යය නැවත පෘතුවිය මත දෘශ්‍ය මාන වන තුරුය.

ඒ නිසා ඉතිරිවූ සුළු යුදෙව් පිරිසට නිතරම යුදා වංශයේ දාවිත්ගේ පරපුරින් මෙසියස් වහනසේ එනතෙක් බලා හිඳීම පුදුමයක් නොවේ. යේසුස් වහන්සේගේ ශිෂ්‍යයන් මහත් ලෙස සතුටු වී නැවත අළුත් කරනු ලැබූ ස්වර්ග රාජ්‍යය ඊශ්‍රායල් දේශයේ පිහිටුවීම බලාපොරොත්තු වූහ. උන් වහනසේ මලවුන්ගෙන් නැගිටවුන පසු ඔවුහු ඇසුයේ "ස්වාමිනි ඔබ මේ අවස්ථාවේ නැවත ඊශ්‍රායල් රාජ්‍ය පිහිටුවන්නේ ද? " යන්නය. (ක්‍රියා 1:6)

ඇත්තෙන්ම ඔවුහු බොහෝ පැදිසි වූහ. යෙරුසෙලමේ තාප්පයට පිටින් ඔහුගේ කුරුසිය මත වූ "යුදෙව්වන්ගේ රජුය" යන නාමය ඔවුහු දැක තිබුණි. ඔහු සොහොන් ගෙයින් පිටතට අවුත් තවත් වරක් ඔවුන් අතරෙහි විය. ඉතා හොඳින් ජීවිතයෙන් සිටින ඇත්තෙන්ම අමරණීයව සිටින හෙයින් ඔවුන් නො ඉවසිලිමත් වූයේ ඔහුගේ හිසමත කිරුළක් සහිතව නැවත දේව රාජ්‍ය පිහිටුවා ගනු ඇති බව මුත් තවමත් එය සිදු නොවිය. දේව රාජ්‍ය පිළිබඳ සුභාරංචිය පලමු කොට යුදෙව්වන්ට පමණක් නො ව සියළු ජාතීන්ට දේශනා කළ යුතු විය. උන් වහන්සේ ඔවුන්ට හොඳින් කීවේ "එවිට නුඹලා මුළු යෙරුසෙලමෙහිද, මුළු යුදයෙහිද, සමාරියෙහිද, පොලොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහ." (ක්‍රියා 1:8)

## යෙරුසෙලම - ලෝකයේ කේන්ද්‍රය

යුදෙව් රාජ්‍යයක යුදෙව් රජකෙනෙකු මත දෙවියන්වහන්සේගේ මෙම රාජ්‍යය කේන්ද්‍රගත වන බැව් අපි දුටිමු. සියළු රජවරු නිවාසයක් ප්‍රධාන නගරයක් බලයේ මධ්‍යස්ථානයක් ඇතිව සිටිති. යෙරුසෙලම ඒ මධ්‍යස්ථානය වන්නේය. වඩාත් ගැලපෙන එක් ස්ථානයක් ඇත්තේ ද? ක්‍රිස්තුස් වහන්සේට වසර දහසකට පෙර යුදෙව් කවියෙකු ප්‍රකාශ කළේ, "උතුරු පැත්තේ තිබෙන මහ රජුගේ නුවර වූ සියෝන් කන්ද උසින් අලංකාරය මුළු පොළොවට පියකරුය." (ගීතාවලි 48:2)

එය අතිඅලංකාර අගනුවරක් වනු ඇත. නිව්යෝක් මොස්කව් හෝ ලන්ඩන් වලට වඩා මධ්‍යගතය. මහද්වීප වන යුරෝපය ආසියාවට හා අප්‍රිකාවට වඩාත් පහසුවෙන් ගණුදෙනු කළ හැක.

මේ රාජ්‍ය ලෝකයට අධිරාජ්‍යයක් වන අතර යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අධිරාජ්‍යයා වන්නේය. මෙය බොහෝ කලකට පෙර එළිදරව් කෙරින. ප්‍රොපේත දානියෙල් විසින් දර්ශනයක් තේරුම් කරමින්, පසුව එන අධිරාජ්‍යයන් වන බැබිලෝනිය පර්සියාව ග්‍රීසිය හා රෝම අධිරාජ්‍යයන් ගැනත්, යේසුස් වහන්සේ එනතුරු කැඩුනු, දුර්වල සහ ශක්තිමත් රාජ්‍යයන් එන බවත්,

දෙවියන් වහන්සේගේ නියෝජිතයා වන යේසුස්වහන්සේ "ගලක්" ස්වරූපයෙන් චිත්‍රගත කොට, ඒ කැරළිකාර ජාතීන් අන්තිම අවස්ථාවේ දී විනාශකර දැමීමට එන බවත් පෙන්විය.

"ඒ රජුන්ගේ දවස්වලදී ස්වර්ගයේ දෙවියන් වහන්සේ කිසිකලෙක නැති නොවන්නා වූ රාජ්‍යයක් පිහිටුවනු ලබන්නේය. එය සියළුම රාජ්‍යවල් පොඩිකර විනාශකර දමන්නේය. එය සදා කාලයට ම පවතින්නේය. (දානියෙල් 2:44)

තවත් අනාගත වාක්‍යමය ප්‍රකාශයක් මෙන්න.

"එවිට ලෝකයේ අධිපතිකම අපේ ස්වාමින් වහන්සේටද, තමන් ක්‍රිස්තුස් වහන්සේටද, වූයේය. උන්වහන්සේ සදාකාලයටම රජ කරන සේක." (එළිදරව් 11:15)

## ලෝකය මත විනිශ්චයන්

අප වැඩිදුර යාමට පෙර යේසුස් වහන්සේගේ පැමිණීමේ දි එහි ආශිර්වාදය මෙන්ම භීතිය ගෙනෙන බව සිහි කල යුතුය. ජාතීන් යටත් කර ගැනීමේදි බොහෝ විරුද්ධවාදීන් නොමැතිව එය සම්පූර්ණ නොවේ. අප කරුණු හතරක් සැලකිල්ලට ගනිමු.

1. "සියළු ජාතීන්" ජෙරුසලමට විරුද්ධව නැගී එනමුත් යේසුස් වහන්සේ ආක්‍රමණිකයන් විනාශ කරන්නේය." (සෙකරියා 14, එසකියෙල් 38. 39) "උන් වහන්සේගේ දෙපා ඔලිව කන්ද මත පිහිටුවන" මොහොතේ,

2. යෙරුසෙලම මහත් වූ භූමිකම්පාවකින් සැලේ. එයින් ඇතිවන පුවිචලයෙන් මහත් වනු ඇත." (සෙකරියා 14:4)

3. සමහර ආණ්ඩු උන්වහන්සේට අභියෝග කර දෙවියන් වහන්සේට හා උන්වහන්සේගේ "අලේපිත" තැනැත්තාට විරුද්ධව සිටින්නෝය. (ගීතාවලි 2:2) නමුත් ක්‍රිස්තුස් වහන්සේට විරුද්ධ වන්නන්ට එහිදි විනිශ්චයක් වේ. (යෙසයා 34ත එළිදරව් 18)

4. එහිදි නැවත නැගිටීමක් හා විනිශ්චයක් වන්නේය. ස්වාමීන් වහන්සේ ප්‍රතික්ෂේප කරන අය මහත් හඬින් හඬනු ඇත. ඔවුහු තමන්ට තිබූ අවස්ථාව ප්‍රතික්ෂේප කලාහුය. අනික් අතින් රජු මෙසේ කියන අයට කෙතරම් සතුටක් ඇතිවන්නේ ද? "මාගේ පියාගේ ආශිර්වාද ලද්දෙනි

වරෙල්ලා ලෝකය පටන්ගැන්මේ සිට නුඹලාට සුදානම් කර තිබෙන රාජ්‍ය භාරගනිල්ලා" (මතෙව් 25:34) කියවන්නාට මේ පිළිබඳව වඩාත් කරුණු සහිතව සහායක පොත් වන "යේසුස්වහන්සේ එන්නේය" "දෙවියන්වහන්සේගේ පොරොන්දුවෙහි ඔබේ කොටස", සහ "විනිශ්චයට නැගී සිටීම", ආදියෙහි කියැවීමට හැකිය.

## රාජ්‍ය ආරම්භ වේ.

මේ සිදුවීම් අවසානයේ රජු තම විජයග්‍රාහි විශ්වාසවන්ත අනුගාමික හමුදාව යෙරුසෙලමට ගෙන්වයි. ක්‍රිස්තුස් වහන්සේගේ රාජ්‍යයේ නියම කටයුතු දැන් ආරම්භ කල හැක. නව දේව මාලිගයක් යෙරුසෙලමේ ඉදිකර ඊශ්‍රායල් හි වංශ 12 තම තමන්ගේ උරුම ප්‍රදේශයන් ඊශ්‍රායලය තුල භාරදෙනු ලැබේ.

ජාතික නානාසතිවරු තමන්ගේ ගෞරවය රජුට පිරිනැමීමට පැමිනීම ආරම්භ වේ. තාර්ශීෂ් සහ ද්වීප වල රජවරු පිඩුම් රැගෙන එනු ඇත. ෂෙබා හා සේබා (අරාබීන්) තෑග පිරිනමනු ඇත. සියළු රජවරු ඔහු ඉදිරියේ වැටනු ඇත. (ගීතාවලි 72:10-11) ශුද්ධ වූ නගරය ආක්‍රමනය සඳහා පැමිණි සතුරන් පවා ඔහුට වැඳීමට එනු ඇත. "යෙරුසෙලමට විරුද්ධව පැමිණි සියලු ජාතීන්ගෙන් ඉතිරිවූවන් වසරක් පාසා රජුට වැඳීමට යෙරුසෙලමට එනු ඇත. සෙනඟගේ ස්වාමීන් වූ රජුගේ කූඩාරම් මංගල්‍යට එනු ලැබේ. (සෙකරියා 14:16)

ජාතීන් ඔවුනගේ සෙනඟ රැස්කොට "එව්" අප ස්වාමීන් වහනසේගේ කන්දට යමුයි, කියති. ඔවුහු මෙසේ කරන්නේ, "එන්න" අපි යමු. සමිඳුන්ගේ කන්දට නගිමු. ඊශ්‍රායල් දෙවිඳුන්ගේ මැදුරට පිවිසෙමු. එතුමාණන් පෙන්වන මාර්ගය ගැන ඉගෙන එහි ගමන් ගන්නට අපට හැකි වනු ඇත. මට ද සමිඳුන්ගේ පණිවිඩය පැමිණෙන්නේ සියොන් කන්දෙන්ය. එතුමන් සෙනඟට කතා කරන්නේ යෙරුසෙලමෙන්ය. (සෙසෙයා 2:3)

මේ උගැන්වීමේ ප්‍රතික්‍රියාව සැලකිය යුතුය. "ජාතීන් ඔවුනගේ කඩු නඟුල් කරන්නේය, ඔවුන්ගේ හෙල්ල දෑකැති කරන්නෝය." නිරායුධවීම ඉතා අලංකාරව විස්තර කර ඇත. එහි නව දුරටත් යුද්ධය නොවන්නේය.

## රාජ්‍යයේ ජනයා

දේව රාජ්‍යයේ ජනයා ගැන අප කරුණු එක දෙකක් පැහැදිලි කල යුතුය. එහි වර්ග දෙකක ජනයා ඇතිවේ. පළමුව අමරණීය (කිසිදාක

නොමැරෙන) පාලකයන් හා ආත්මික නායකයන්. දෙවනුව රාජ්‍යයේ පුරවැසියන් වන මැරෙන සුළු (මරණයට විනාශ වන) අයය.

පළමු කණ්ඩායම යේසුස් වහන්සේ විශ්ව රජු වශයෙන්ද, ඇතුලුව ඒබ්‍රහම් දාවිත් හා අනිකුත් වටිනාකම් ඇතියවුන් අධිරාජ්‍යගේ ගෞරවය හිමි අපොස්තුලුවරු දොලොස්දෙනා, යේසුස් වහන්සේගේ විශ්වාසී අනුගාමියන්, "සාන්තුවරු" අදිහු පාලනය කරන්නවුන් නව යුගයක උගන්වන්නාවුන්ය.

දෙවන කණ්ඩායමට අයත් වන්නේ යේසුස් වහන්සේ එන විට ලෝකයේ සිටින මැරෙන සුළු මිනිසුන්ය. ඔවුහු පොළොවේ විනිශ්වය ද, යේසුස් වහන්සේ තමන්ගේ රජු වශයෙන් පිළිගන්න කැමති අද, වේ. මේ අයට ඊශ්‍රායලයේ ජිවත්වන්නට ඉඩලද, යුදෙව්වන්ද, ඇතුලත්වේ.

## අමරණීය වූවන්

අමරණීයත්වය යනු විශ්වාසීව කිකරු වී දෙවියන් වහන්සේගේ අණපනත් පැවැත් වූ සියළුම ඉතිහාසයේ කාලවල සිට යේසුස් වහන්සේ පොළොවට එන තෙක් සිටියවුන්ට දෙවියන් වහන්සේ දෙන සදාකාල ජිවිතයයි. මෙය සියළු වර්ග වලින් සහ භාෂා වලින් මිනිසුන්ගෙන් හා ජාතින්ගෙන් අපගේ දෙවියන් වහන්සේට රජුන් හා පූජකයන් වී අප පොලොව මත පාලනය කරන්නත් වී ඔවුහු වසර දහසක් යේසුස් වහන්සේ සමඟ වසමින් පලනය කලහ. (එළිදරව් 5:9,10, 20:4)

අප අමරණීය වූවන් අවතාර ලෙස නොසිතිය යුතුය. නැවතනැගිටීමෙන් පසු යේසුස් වහන්සේ අමරණීය වුහ නමුත් ඔහු ඔහුගේ අනුගාමිකයන් සමඟ කෑම බීම ගත්තේය. තවද, ඔහුගේ සැලකිය යුතු ශාරීරික බලය පෙන්වීය. අමරණීය සිරුරක අපට මෙන් මස් හා ඇට තිබේ. එහෙත් එය දෙවියන්ගේ ආත්මයෙන් ශක්තිමත්ය. එය අසනීප වලින් හෝ දුබල වීමකින් වේදනා නොලබයි.

ඕනෑම බුද්ධිමත් පාලකයෙකු මෙන් යේසුස් වහන්සේ ඔහුගේ රාජ්‍ය ගෙන යාමට නියෝජිතයන් සුදුසු ලෙස පුහුණු වූවන්ගෙන් පත් කෙරේ. ඔවුන් අතර උසස් ව සිටින්නන් බයිබලයේ පැහැදිලිව පෙනෙන නිදයුන් වූ ආබ්‍රහම් වැනි විස්වාසී වූවන් රජු සමඟ ලගින් හැසිරීමට හැකි වේ. රෝම 4:13 හි ඔහු විස්තර කර ඇත්තේ "ලෝකයේ උරුමක්කාරයා" ලෙසය. "මාගේ සේවක දාවිත් සදාකාලිකව ඔවුන්ගේ කුමාරයෙක් වන්නේය." (එසකියෙල් 37:25)

ඊසාක් යාකොබ් සහ ජෝසප් මෝසෙස් හා සැමුවෙල් එහි සිටිනු ඇත. සාරා රාහබ් සහ රූත් මරියා සහ එලිසබෙත් යන ස්ත්‍රීහු සිටිනු ඇත.

අපෝස්තුලුවරු දොලොස් දෙනාට ඔහු පොරොන්දු වූ අයුරින් විශේෂ කාර්යයක් ඇත.

"සැබැවක් නුඹලාට කියමි. අළුත් උත්පාදයේදී මනුෂ්‍ය පුත්‍රයා තමන්ගේ තේජසින් සිංහාසනය පිට වැඩ හිඳින කල මා අනුව ආවා වූ නුඹලා ඊශ්‍රායල් ගෝත්‍ර දොළොස විනිශ්චය කරමින් සිංහාසන දොළොසක් මත හිඳින්නාහුය." (මතෙව් 19:28)

දානියෙල්ගේ පොතෙහි ප්‍රොපේතවරයා මහපොළොව මත දේව රාජ්‍ය ගැන දර්ශනයක් දිටිය. ඔහු පාලකයන් විය යුත්තේ කවුද පිළිබඳව කියා ඇත.

"මහෝත්තමයාණන්ගේ සාන්තුවරු රාජ්‍ය ගෙන සදාකාලේටම එය හිමි කරගන්නේය." (7:18)

මේ අමරණීය පාලකයින්ට "ශාන්තුවරුයි" කීමට ඇති විශේෂය කුමක්ද? "ශාන්තුවරයා" යනු අදහස වන්නේ ශුද්ධවූවෙක් හෝ වෙන්වූවෙක් ය. යම් කෙනෙක් දිව්‍යමය කරුණු පිළිබඳ කැපවීමට තෝරාගත් කෙනෙකි. පැරණි ඊශ්‍රායල් ආණ්ඩු කිරීමට මෝසෙස් ට උපකාරීවන පිනිස තෝරාගෙන ශුද්ධාත්ම බලය දුන් මිනිසුන් මෙනි. ඔවුහු "හැකිකම ඇති මිනිසුන්, මෙන්ම දේවභය ඇතිවුන් සත්‍යයේ මිනිසුන් වංචාවට අකැමති වූවන්ය." නමුත් ඔවුන් තුල එක් විශාල වෙනසක් වූයේ ඔවුහු කල්යාමේදී මිය ගියහ. නමුත් අනාගත පාලකයෝ නොමියෙන හෙයින් ඔවුන් මහලු වයසේ ඇති වන දුර්වල තත්වය නිසා තම හැකියාවන් නැති කර ගන්නේ නැත.

රජුට නියම මිනිසුන් හා ස්ත්‍රීන් තෝරා ගැනීමට ශක්තිය ඇතිවේ. එබැවින් ප්‍රයෝජනවත් සේවය සඳහා සිත හා සිරුර වර්ධන වීමට පටන්ගැනීම වන්නේ ඔවුන්ගේ මේ ජීවිතයේදීය.

## සදාකාල ජීවනයේ ප්‍රමිතිය

මේ පාලකයන්ට හා ගුරුවරුන්ට සදාකාල ජීවනය නිසා පුදුමාකාර ප්‍රයෝජන අත්වේ. නිරෝගී මනසක් හා ශාරීරිකව මනා කයක් ඇති ඔවුහු ශක්ති නාශක ප්‍රතික්‍රියා සහිත රෝග හෝ දුබල බවින් නොපෙළේ. "ඔවුන්ට බඩගිනි හෝ පිපාසය තවදුරටත් නොවේ. සූර්ය තාපයවත් දැවෙන ග්‍රීෂ්මයවත් ඔවුන් පෙළන්නේ නැත. දෙවියන් වහන්සේ ඔවුන්ගේ ඇස් වලින් කඳුලු පිසදමන සේක." (එළිදරව් 7:16-17) ඔවුන්ගේ ස්වාමියා මෙන් ඔවුහු "මිනිසුන්ගේ සිත්

තුළ ඇත්තේ මොනවාදැයි දකිති" මිනිස් ප්‍රශ්න වලට නො වරදින නිධානය සෙවීමට හැකිවේ. කරදරකාරීන් ඉවත් කිරීමට හැකියාව ඇති අතර අසල්වාසීන් අතර කරදර ස්ථාන සම්පූර්ණ කිරීමට හැකියාව ඇති අතර අසල්වාසීන් අතර විශ්වාසය දියුණු වේ. වර්තමාන ලෝකයේ අති කරදර ස්ථාන සම්පූර්ණ කිරීමට හැකිකම කෙසේ දැයි බලන්න.

මොන විදියේ නවසංස්කරණයක් ක්‍රියාත්මක වීමට ක්‍රිස්තුස් වහන්සේගේ අමරණීය පාලකයන් යෙරුසෙලමේ සිට ලොවපුරා යැවූ විට පටන්ගන්නේ ද? බයිබල් සිද්ධාන්ත මත පිහිටි නව නීති රීති මගින්, බෙදී වෙන් වූ දේශපාලනය කපා හරින අතර, වහාම අතිමහත් ආගම් වාදවලට හේතුව ඉවත් කෙරේ.

## වසර දහසක සාමය

ඇත්තෙන්ම මිනිසුන්ට තමන්ගේ ජීවිත මාර්ගයේ වාසිය තේරුම් ගැනීමට හා වෙනස්කම් කිරීමට කාලය ගතවන්නේය. එය එක් රැයකින් සිදුවන්නක් නොවේ. දෙවියන් වහන්සේගේ වැඩපිළිවෙල සම්පූර්ණ වීමට පෙර පොළොවේ ජනයා නව ප්‍රබෝධයකට පත්වීමට වසර දහසක් ගතවේ.

ඇතිවෙන්නාවූ යුගය එඩා හොඳ සුරංගනා දේශයක් වන්නේ යැයි අප නොසිතිය යුතුය. එය නියම ලෝකයක් වන්නේය. එය විනිශ්චය පරදවා ක්‍රිස්තුස් වහන්සේ ලෝක පාලකයෙකු ලෙය සලකන අයගෙන් පිරී යනු ඇත. උන් වහන්සේ "යකඩ දණ්ඩකින්" ලොව පාලනය කරනු බැවි ඔවුන් වටහා ගනු ඇත. නමුත් මැරෙන සුළු ජාතින් තවමත් ඔවුන්ගේ සිරිත් විරිත් හා සහසත්වයන් සහිත වන අතර ඔවුනගේම ජාතීන්ට අයත් වටපිටාවකින් යුතුය. පාලකයන් අන්‍ය භාෂාවලින් කථා කිරීමේ හැකියාව සහිත වන බැවින් හෝ සමහර විට බාබෙල්හි පටලැවිල්ල (උප්පත්ති 11 බලන්න)ට පෙර මෙන් ආපසු සම්පූර්ණයෙන් වෙනස් කර, එකම විශ්ව භාෂාවක් ඇති කර අවබෝධ කර ගැනීමේ දුෂ්කරතා මගහැරී යනු අතර එමගින් විවිධ භාෂා අතර ඇති සැකය නැති වනු ඇත.

## යුක්තියේ යහපත් ක්‍රමය

ලොවපුරා සියළු මට්ටම්වල සහසත්වයන් හි ජනතාව අතර සහයෝගය සහ සතුට වර්ධනය කිරීමට බලයයන් ක්‍රියාත්මක වේ. දෘෂ්ඨීන්, ධනවාදය, සමාජවාදය, දුෂ්ඨ පාලකයින්ගේ නපුරු පාලනයන් මගින් පවා ඒවා පාලනය කල නොහැකි විය. ඒවා කෑදරකම, දුෂිතකම, රජයේ දීමනා, අල්ලස

හා පෞද්ගලික බලය වේ. මේ සියල්ල වෙනස්කරන්නට යන්නේය. දුප්පතුන්ට එහිදි යුක්තිය වන්නේය. විශේෂ අයිතිවාසිකම් යටතේ දුප්පතුන්ට යහපත් සංග්‍රහ ලැබෙනු ඇත. යේසුස් වහන්සේ එය සහතික කරන්නේය.

"උන්වහන්සේ තමන් ඇසට පෙනෙන හැටියට විනිශ්චය කරන්නේ වත් තමන් කනට ඇසෙන හැටියට විනිශ්චය කරන්නේ වත් නැතුව ධර්මිෂ්ඨකමෙන් දිළිඳුන් විනිශ්චය කොට පොළොවේ යටහතුන් උදෙසා ධර්මිෂ්ඨකමෙන් නිශ්චය කරන සේක. ස්වකිය මුඛය නැමැති යෂ්ඨියෙන් පොළොවට පහර දී තමන්ගේ තොල්වල හුස්මෙන් දුෂ්ඨයන් මරණ සේක. (යෙසයා 11:3-4)

"කුමාරවරු විනිශ්චය පාලනය" කරන විට, (යෙසයා 32:1) සමාජයේ සියලු සමබරතාවය වෙනස් කෙරේ. තවදුරටත් පොහොසතුන්ට එක් නීතියක් ද දුප්පතුන්ට තව එකක් ද නොවනු ඇත. ඔබ වොෂිංටන්, මොස්කව් හෝ බීජිං සිටියත් කන්ද උඩ දේශනාව පදනම්කර ගත් දිව්‍යමය සිද්ධාන්ත රජු විසින් යෙරුසෙලමේ ඔහුගේ අධිකරණයේ යොදනු ඇත.

මෙය මිනිසුන්ගේ ජිවිත වලට බලපාන්නේ කෙසේද? අපරාධකරුවන් සහ පාදඩයින්, ඔවුන්ගේ සිත් විනිවිද දකින විනිසුරුවන් දකින විට සහ අපරාධයට නිසි දඬුවම ලැබෙන බව දකින විට, ප්‍රීතිමත් සහ සෞභාග්‍යමත් ජිවිතයක් සඳහා තමාගේ අසල් වැසියාට ප්‍රේම කිරීම සහ අවංක බවේ සහ සත්‍යයේ වැදගත්කම ඉක්මණින් ඉගෙන ගනු ඇත. පවුල් හා අසල්වාසින් සම්පූර්ණ සුහදතාවෙන් යුතු වන අතර අවිනිශ්චිතබව පහව ජාතික හා ජාත්‍යන්තර නිදහස උතුරා යනු ඇත.

"සියලු දෙනාම හරි දේ කරන බැවින් සාමයත්, ආරක්ෂාවත්, සදහටම පවතින්නේ ය." (සෙයසා 35:5-6)

මෙම අමරණීයයන් පනවන ලද බාධක නිසා මිනිස් ස්වභාවයේ නරකතම සීමා ඉක්මවා යාම් නවතිනු ඇත. පසුතැවිලි නො වන පව්කාරයන් හට මරණ දඬුවම ලැබෙන අතර, ඔවුන් අත් විඳින දිර්ඝ ජිවිත කෙටි කරනු ඇත. "තමන්ගේ තොල් වල හුස්මෙන් දුෂ්ඨයන් මරණ, අතර, අවුරුදු සියයක් වයස් වූ පව්කාරයා ශාප ලබනවා ඇත." (යෙසායා 11:4 හ 65:20)

## හොඳ සෞඛ්‍යය

යෙසායා මෙසේ පවසයි:

"දවස් ගණනක ළදරුවෙක්වත් වයස් නොපිරුණු මහල්ලෙක්වත් එමගින් තවත් තුරන්දු නොවී, බාල දරුවා අවුරුදු සියයක් වයස්ව නසිනවා ඇත." (65:20)

බොහෝ සංවර්ධනය වන රටවල තවමත් ශාපයක්ව පවතින ළදරු මරණ තුරන් කරන බව මෙය හඟවයි. කවරෙකු හෝ අවුරුදු 100 කට ළඟා වෙනවාද, ඔහු තවමත් දරුවෙකු වශයෙන් ගණන් ගැනෙනු ඇත. අවුරුදු 40 හෝ එපමණ ආයු කාලයක් සමහර රටවල මිනිස් ආයු කාලය ඇති අතර, වෛද්‍ය විද්‍යාව දියුණු රටවල එය ගීතාවලිය ලියන්නාගේ "සම්පූර්ණ ජීවිතය" වුවත්, එය වර්තමාන තත්වයෙන් කෙතරම් වෙනස් වනු ඇත් ද? ළමා කාලය ප්‍රබෝධයක් වනු ඇත. මහළු කාලය ලජ්ජා වීමට නොව මක් නිසාද "මහල්ලෝ ද මහළු ස්ත්‍රීහු ද එකිනෙකා වයස් වැඩිකම නිසා තමාගේ සැරයටිට අතේ තබාගෙන පෙරුසරම් වීදි වල ඉඳගෙන ඉන්නවා ඇත. එහි වීදි වල සෙල්ලම් කරන පිරිමි ළමයින්ගෙන් සහ ගැණු ළමයින්ගෙන් නුවර වීදි පිරී තිබෙන්නේ ය." (සෙකරියා 8: 4, 5)

මහා වෛද්‍යවරයාණන් වන යේසුස් වහන්සේට උන් වහන්සේගේ පළමු මෙහෙයේ දී අසණීප සුව කරන්නටත්, උපත් අන්ධයන්ට පෙනීම දෙන්නටත්, මළවුන් නැගිටුවන්නටත් පුළුවන් වුයේ නම්, අනාගතයේ දී උන් වහන්සේගේ සහ උන් වහන්සේගේ ආධාරකරුවන් මේවා සහ තව බොහෝ දේ කරනු ඇත. ලෝ වැසියන් දිව්‍යමය ප්‍රමිතීන් කෙරෙහි හැරී සුදුසු කොටස් වලින් උපකාර බලාපොරොත්තු වන විට, හදවත් රෝග සහ පිළිකා නැමැති ශාපයන් නොපෙනී යනු ඇත. පවුල් ජීවිතයේ දී, විවාහයට නැවත ගරු කිරීමේදීත්, සුදුසු ලිංගික හැසිරීමේදීත් ඒඩ්ස් වැනි වසංගත ජාතීන් පීඩාවට පත් නොකරනු ඇත. සුභාරංචිය වන්නේ:

"එකළ අන්ධයන්ගේ ඇස් පැදෙන්නේය. බිහිරන්ගේ කන් ද ඇරෙන්නේ ය. එකළ කොරා මුවකු මෙන් පැන යන්නේය. ගොළුවාගේ දිව ගී කියන්නේ ය." (යෙසායා 35: 5-6)

## සියල්ලන්ගේ යහපත සඳහා ලෝක සම්පත්

අපේ නවීන ගින්ධාචාරය මහත් ඛණිජ සම්පත් තිබියෙදිත් ආහාර නිෂ්පාදනයට ඇතිතරම් ඉඩම් තිබියෙදිත් වැඩිවන ජනගහනයට ආහාර සැපයීමට මිනිසාට නොහැකි බව පෙනීම කණගාටු වට හේතුවන කරුණකි. ඔහුට මෙම ග්‍රම කළමනාකරණය හෝ සම්පත් බෙදා හැරීමට නොහැක. නමුත් එය කල හැකිය. මැවුම්කරු මේ ත්‍යාගවන්ත පොළොව සැකසීමේ දී මෙම සම්පත් විය. අවශ්‍ය දෙය වන්නේ නිවැරදි මනසක් ඇති මිනිසුන්ය. දායකත්වය සහ අධිකාරිත්වය ඇති අය මේ භෞතික ගැටළු විසඳීමටත් සම්පත් සංවිධානයටත් අවශ්‍යය.

යේසුස් වහන්සේ මහත් ගුරුවරයෙකු මෙන්ම සංවිධායකයෙකු වූ බව සිහිකිරීම වටින්නේය. ඔහුට දහස් ගණන් ස්ත්‍රී පුරුෂයින් ලමුන් හට, පනහ සියය බැගින් කණ්ඩායම් වශයෙන් කෑම දීමට සහයකයින් දෙලොස් දෙනෙකු සමඟ හැකි විය. එමෙන්ම ඔහුට දේව රජ්‍ය මහපොළොව මත පිහිටි විට ලක්ෂ ගණන් නිරාහාර අයට කෑම දීමට හැකිවනු ඇත. ඉතියෝපියා මොසැම්බික් හෝ බංග්ලාදේශයේ සිදුවූ හද පැලියන සිදුවීම් තව දුරටත් පසුගිය දේවල් වනු ඇත. යුරෝපයේ ආහාර ගබඩාවල කෑම කඳු දිරා යන්නේ ද නැත. විකුණුම් මිළ ඉතා අඩුවනු නිසා ඇමෙරිකානු අස්වැන්න ගිනි නො තබනු ද ඇත.

බයිබලය පොළොව මත ශාපය ඉවත් කරන බව පවසමින්, සේවය කරන්නන්ට සෑහෙන ආහාර ඇති වන බව පවසන්නේය“ එහි කඳුමත පලතුරු ලෙලදේවා. ලෙබනන්හි මෙන් සොලවනු ලබයි, (ගීතාවලි 72:16) හි දාවිත් රජු කිය. “කඳු වලින් අළුත් මිදි යුෂ වෑහෙනු ඇත” “කඳු වලින් කිරි වෑහෙනු ඇත, යුදයේ ගංගා ජලයයෙන් පිරෙනු ඇතැයි” ජොවෙල් කිය. (3:18) (ඒමොස් 9: 13) “බීජයන් සාර්ථක වේ. මිදිවැල් ඒවයේ ඵල දෙනු ඇත. පොළොව එහි ඵල වැඩිකරයි. අහසින් දිය දහරා වැටේ”. (සෙකරියා 8:12)

ඊලඟට ප්‍රොපේත යෙසයාගේ කාන්තාරය රෝසමල් පිපෙන්නා මෙන් ප්‍රීතිමත් වන අයුරු දර්ශනය (35:1), අප්‍රිකාවේ විශාල ප්‍රදේශ, මැද පෙරදිග, ආසියාවේ වසරක් පාසා වැලිකඳු සාරවත් පෙදෙස් වසාගැනීමෙන් ලක්ෂ ගණනින් සෙනග මරණයට පත්වීම සිතන්න. ආණ්ඩුවලට විශාල මුදල් වැයකර භූගත ජලය සැපයීම කල නොහැකි බව පෙනේ. කාන්තාර ජනයාට විශාල ජලයෝජනා ක්‍රමවල යෙදීමෙන් ඔවුන්ගේ දේශයට නව සශ්‍රීකත්වයක් ගෙන ඒම කොතරම් වාසනවක්ද? මේවා දෙවියන්වහන්සේගේ රාජ්‍ය තුල පමණක් කළ හැකි වීම පුදුම සහගත දෙයක් වේ.

## සම්පූර්ණත්වයෙන් ජීවත් වීම

ජනයා මහත් නගරවල සිරවී නොසිට, නගර වැසියන් නිම්න වලට හා වනාන්තර ප්‍රදේශ වලට යාමට හැකි ලෝක ව්‍යාප්ති ආරක්ෂා ව්‍යාපෘති ඇතිවේ. දෙවියන් මිනිසුන් මහා නගර වල ජීවත් වීම ධෛර්යමත් නො කෙරුනි. ඒ මනුෂ්‍යත්වයට වඩාත් ද්‍රෝහි වූ දුර්ජන මිනිසුන් සතු අඳුරු ස්වභාවයන් එහි ස්ථානවල සැඟවුනු නිසා වේ. අනික් අතින් ක්‍රිස්තුස් වහන්සේගේ වැඩිදුර දියුණු කල තත්වයන් යටතේ මිනිස් ශක්තින් එහි උච්චස්ථානයට පත්ව මිනිස් මනස එහි දියුණු කල හැකි උපරිම තත්වයට පත්වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සියළු ලෝවැසියන්ට අප්‍රමාණ වූ සේවයක් එබඳු හැකියාවන් තුළින් ලබා ගැනීමට ඉඩකඩ ලැබෙනු ඇත. සියළු දෙන අප කටයුතු වලින් “තෘප්තිමත්” වන්නේ යැයි කියන තත්වයට පත්වේ.

"ඔවුහු ගෙවල් ගොඩනගාගෙන එහි පදිංචි වන්නෝය. මාගේ සෙනඟ බොහෝ කල් ජීවත් වන්නාහ. මිදිවතු වවා එහි ඵල කන්නෝය. ඔවුන් ගෙවල් ගොඩනැගුවාට වෙන කෙනෙක් වසන්නේවත් වැව්වාට වෙන කෙනෙක් කන්නේවත් නැත. මගේ සෙනඟේ දවස් වෘක්ෂයක දවස් මෙන් වන්නොය. මාගේ සෙනග බොහෝ කල් ජීවත් වන්නාහ මාගේ තෝරාගත් අයගේ අත්වලින් උපයා ගත් දේ භුක්ති විඳින්නෝය. (යෙසාය 65:21-22)

## අරාබිනු යුදෙව්වන් සමග වැඩකරති.

පැරණි සතුරන් සමඟ සුහද වීම වඩාත් ප්‍රීතිදායක ප්‍රතිඵල සහිත දෙයක් වේ. වෘකයා සහ බැටලුවා එක්ව ආහාර ගැනීමේ ප්‍රොපේත වරයාගේ දර්ශණය මිනිසුන් හා සතුන් අතර සුහදකම අලංකාර විස්තරයක් පමණක් නොවේ. එය අනාගතයේදී ඇතිවන, අතීතයේ යුද්ධකල ජාතීන් අතර සාමය පිළිබඳ විශේෂ සඳහනකි. යෙසයා කථා කරන්නේ, ආරාබීන් යෙරුසෙලමට පැමිණ "උන්වහන්සේට ප්‍රශංසා කිරීම" ගැනය. (යෙසයා 60:6) ඔහු විස්තර කරනුයේ නව නගරයේ තාප්පය ඉදිකිරීමට උපකාරකරන ඔවුන්ගේ පැරණි අර්ධ සොයුරු ගොවියන් සමඟ වැඩකරන, ඔවුන්ගේ රැල් කවන ගොවියන් සහ මිදිවතුවවන්නන් ගැනය. මැද පෙරදිග වර්තමාන තත්වයේ පුදුම සහගත කණ පිට පෙරලීමකි. ආබ්‍රහම්ගේ පවුලේ ආරබි ගාථාවට බොහෝ කලකට පෙර දේවියන් වහන්සේ දෙන ලද පොරොන්දුවක් ඉටුවීමකි.

## එය කොපමණ කලක් පවතී ද?

මේ කරුණාවන්ත රාජ්‍යයේ කටයුතු සදහට පවතී ද? දෙවියන් වහන්සේ මිනිසාට ජීවත් වීමට මහපොළොව සැකසීමේදී පිළිතුර වන්නේ "ඔව්" යන්නය. නමුත් ක්‍රිස්තුස් වහන්සේගේ රාජ්‍ය සදහට ජීවත් වන පාලකයන් විසින් පාලනය කරනු ලැබුනත් තවමත් මැරෙන සුළු ජනයා ගෙන් යුක්ත වනු ඇත. මනුෂ්‍ය ආකල්ප හා පව්කාරකම තවමත් ඇති අතර දෙවියන් වහන්සේ කාල සිමාවක් යොදා ඇත්තේ ඒ නිසාය. දෙවියන් වහන්සේ එය දන්නා බැවින් ලෝවැසියන්ට දිව්‍යමය රෙගුලාසි යටතේ ජීවත් වීම සම්පූර්ණයෙන් ඉගැන්වීමට වසර දහසක් ගන්නේය. ඒ වන විට ඔවුහු සදාකාල ජීවනය ලැබීමේ පුදුමාකාර ප්‍රයෝජනය දිර්ඝකාලීන අවබෝධයකින් ලබා ගනු ඇත.

මෙසේ සහශ්‍රයක රාජ්‍යකාලය අවසානයට එනු ඇත. එය උවමනාවෙන්ම රජතුමන්ගේ ශක්තිමත් පාලනය ලිහිල් කිරීමක් වන්නේ සමහර පාලිතයන් තුළ කැරලිකාර සේයා මතු පිටට ගෙන ඒමෙන් උන් වහන්සේගේ කැමැත්තට සාහසික අභියෝගයක් එල්ල කිරීමට ඉඩ දීමක් වශයෙනි.

(එළිදරව්ව 20 බලන්න) මේ නීති විරෝධී වුවන් යෙරුසෙලමට පහරදෙනු ඇත. එහෙත් ඔවුන් සහමුලින්ම විනාශ වනු ඇත. එය මිනිස් වර්ගයාගේ අවසාන මාරාන්තික වේගවත් පහරදීම වන්නේය. සහශ්‍රකයක අවසානය "කාලයන්ගේ සලකුණු" අවසානය ඉතා ආසන්න බැව් සලකුණු කරනු ඇත.

කැරැල්ල අවසන් වු විට රජු සහ ගැලවුම්කරු වශයෙන් ක්‍රිස්තුස් වහන්සේගේ කාර්ය බොහෝ දුරට අවසන්ය. වසර දහස තුල මිය ගිය වුන් ඔවුන්ගේ රජ සහ විනිසුරු හමුවීමට සොහොන් වලින් නැගිටවිය යුතුය.

"මළා වූ ලොකු අයද, පොඩි අයද, සිංහාසනය ඉදිරියේ සිටිනවා දුටිමි. පොත් ද, දිගහරිනු ලැබුවේය. මලානු තමන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියන ලද දේවලින් විනිශ්චය කරනු ලැබුවේය." (එළිදරව් 20:12)

නැගිටවනු ලැබුවන් අතර ජීවත් වන්නවුන් ලක්ෂ ගණන් සිටිනාහුය. ඔවුහු දැන් ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මිෂ්ඨ විනිශ්චය බලා සිටිනු ඇත. කැරලි කරුවන් හා යමෙක් මිනිසුන්ගේ නරක ක්‍රියාවල යෙදී සිටියාහු ද ඔවුහු මිය යනු ඇත. "ගිනි වලට" හෙලීමට නියම කරනු ඇත. එහි නැවත ආපසු ඒමක් නැත. අනික් අතින් ක්‍රිස්තුස් වහන්සේගේ පොළොවේ රාජ්‍යයට විශ්වාසී වුවත් ඔවුන්ගේ ත්‍යාග ලබනු ඇත. ඔවුන්ගේ පාලකයන් වසර දහසකට පෙර ලැබූ සේ ඔවුහු ද සදාකල ජීවිතය ලබනු ඇත.

## "ඔබගේ රාජ්‍ය එනු ලැබේවා."

මේ සිදුවීම් වලට පසුව මහපොළොව සදාකාල ජීවනය ලද ස්ත්‍රී පුරුෂයන් ගෙන් පමණක් ජනාවාස වනු ඇත. රජු වශයෙන් ස්වාමි වූ යේසුස් වහන්සේගේ ක්‍රියාව අවසානය. මනුෂ්‍යයාගේ හැකියාවේ මහත් විනාශකරුවන් වන පාපය සහ මරණය යටත් කර ගෙන ඇත. උන් වහන්සේට පාලනය කිරීමට නැසෙන සුලු පාලිතයන් නොමැත. දෙවියන් වහන්සේගේ කැමැත්ත දැන් පෘතුවියේ ඇත්ත වශයෙන් ම සිදු වී ඇති අතර දෙවියන් වහන්සේගේ යාච්ඤාවට පිළිතුරු ලැබී ඇත. අපෝස්තුලු පාවුල් එය කොරින්ති 15 පවසන අයුරු:

"එවිට කෙළවර පැමිණේ. උන් වහන්සේගේ සියලු අධිපතිකම් ද, බලය ද, පරාක්‍රමය ද, නැති කළ කල්හි උන් වහන්සේගේ රාජ්‍යය පියවූ දෙවියන් වහන්සේට භාර දෙන සේක. මක් නිසා ද? උන් වහන්සේගේ සියලු සතුරන් තමන් වහන්සේගේ පාද යට දමන තුරු රජකම් කරන්නට ඕනෑය. නැතිකරනු ලබන අන්තිම සතුරා නම් මරණයය. තව ද සියල්ල උන් වහන්සේට යටත් කරනු ලැබුවාම දෙවියන් වහන්සේ සියල්ලන් තුළ සියල්ල වන පිණිස

පුත්‍රයාණන් වහන්සේත් තමන්ට සියල්ල යටත් කළ දෙවියන් වහන්සේට යටත් වන සේක." (පද 24 - 28)

අපට එය වඩාදුරට සිතීමට දුෂ්කර වන අතර දෙවියන් වහන්සේ "සියල්ල කෙරෙහි" වන්නේය යන්නෙහි තේරුම දැකීමට අපහසුය. නමුත් එය පොළොව සම්බන්ධ ව මැවුම්කරුගේ මහත් අපේක්ෂාවේ උච්ච ස්ථානය වනු ඇත-එය මහත් පුදුම සහගත වනු ඇත.

"මා ඇත්තෙන්ම ජීවත්වනවා සේ ම, සියළු පොළොව ස්වාමීන් වහන්සේගේ මහිමයෙන් පිරී යා යුතු වේ." (ගණන් කථාවේ 14:21)

මේ පුදුමාකාර අනාගතය ඔබෙන් මහහැරියන්ට ඉඩ නො දෙන්න. යෙසුස් වහන්සේ ඉක්මනින්ම මෙහි පැමිණෙන සේක. කරුණාකර ඔබේ බයිබලය කියවන්න. ඔබේ මුළු හදින්ම යාඥා කරන්න.

"ඔබගේ රාජ්‍ය වනු ලැබේවා අහසේ මෙන් පොළොවේ ඔබේ කැමැත්ත ඉටුවේවා"

- ස්ටැන්ලි ඕවන් -

## ප්‍රශ්න

1. උන්වහන්සේ පෘථිවිය මවන විටදී දෙවියන්වහන්සේගේ අභිප්‍රාය කුමක්විද ?

2. ''ඔබගේ රාජ්‍යය පැමිණේවා. ඔබෙගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළවෙහිද වේවා'' යැයි යේසුස්වහන්සේ යාච්ඤා කලේ ඇයි ? උන්වහන්සේගේ යාච්ඤාව ඉටුවන්නේ කවදාද ?

3. මෙම රාජ්‍යය කොතැනක තිබෙනු ඇතිද? එහි අගනුවර කමක් වනු ඇත්ද ?

4. මෙයට ප්‍රථම පෘථිවිය මත දෙවියන්වහන්සේගේ රාජ්‍යය තිබී ඇතිද ? එම රාජ්‍යයට කුමක් සිදුවීද?

5. ඔහුගේ පියාවන දාවිත්ගේ සිංහාසනය පිරිනැමීමට දෙවියන් වහන්සේ පොරොන්දුවුනේ කාහටද ? දෙවියන්වහන්සේ මෙම පොරොන්දුව වූයේ කවදාද?

6. මෙය සිදුවන්නේ කවදාද?

7. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ රාජ්‍යය පිහිටවූ පසු, මනුෂ්‍යයාගේ පාලනයටත් රාජ්‍යයටත් කුමක් සිදුවේද ?

8. දෙවියන්වහන්සේගේ රාජ්‍යය කොපමණ කලක් පවතීද ?

9. දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමක් වැනිද ?

10. පෘථිවියත් එහි වැසියනුත් පාලනය කිරීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේට උපකාර කරන්නේ කවුද ?